ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 118/ News/ 2011
ක්‍රි. ව. 2011 නොවැම්බර් 28 සඳුදා
04 වෙළුම - 06 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



# සාන්ත නිකොළාවූ මුනිතුමා
# හෙවත් නත්තල් සීයා !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# සා. නිකොළාවු මුනිතුමා - නත්තල් සීයා නම් ලත් කතෝලික අපගේ සාන්තුවරයායි.

## ආදරණීය දුවේ පුතේ...

අද අපි කථා කරන්න යන්නේ පුංචි ඔබ කවුරුත් ඇඩිව ආදරය කරන සාන්තුවරයෙක් පිළිබඳවයි. දෙසැම්බර් මාසය ආරම්භ වන විටම මෙම සාන්තුවරයාගේ මංගල්‍යයත් සිහිපත් කරනවා. සා. නිකොළාවු මුනිතුමා කතෝලික සභාව කවදත් ආදරය කරන මුනිවරයෙක්.

ආදර දුවේ පුතේ, කිතු වසින් තුන් වන ශත වර්ෂයේ අග භාගයේදී ඉතාලියේ ලිසියා නම් පළාතේ පාත්තර නැමැති ගමේ විසූ ධනවත්, වංශවත් ප්‍රභුවරයෙකුවූ එපිපානි හා ජුවානා නම් යුවලට දාව නිකොළා උපත ලබනවා. ධර්මිෂ්ඨ දෙමව්පියන් තුළින් උපතේ සිට දහම් ලැදි බව ලබා වැඩුණු මෙතුමා නිරන්තරයෙන්ම දේවස්ථානය හා සමග සමීප සම්බන්ධතාවයක් දැක්වුවා. තමන්ගේ තරුණවියේදීම මව්පියන්ගේ වියෝවීමත් සමග සම්පූර්ණයෙන්ම ලෞකික ආශා ත්‍යාජ කළ තරුණ නිකොළා ක්‍රමයෙන් තාපස දිවියකට තම ජීවිතය හරවා ගන්නවා.

පියාගෙන් තමාට හිමි වු මහත් ධනස්කන්දය රහසේම දුගී මගී යාචකයන් අතර බෙදන්නටත් අවශ්‍යතාවලින් පෙළුණු අසරණයින් සනසන්නටත් කැපුවුණු මේ නිකොළා තරුණයා වඩාත් ප්‍රසිද්ධ වන්නේ තවත් එක් සිදුවීමක් නිසයි. ඒ නම් තම තරුණ දියණියන් තිදෙනා සරණ පවා දීමට මඟක් නැතිව ලතවුණ කුලවතෙකුට රහසිගතව ධනය සපයා දී එම තරුණියන් හට පිහිට වීමේ සිද්ධියයි.

තමන් සතුවු සියළුම ධනය අවසානය තෙක් දිළිඳුන් අතර බෙදා දීම නිකොළා තරුණයාගේ අභිප්‍රාය වුණා. "දිළිඳුන්ගේ පියා" යන අන්වර්ථ නාමය ද මේ හේතුවෙන් මෙතුමාට යෙදුණා. ශුද්ධවු දේශයට වන්දනා ගමනක් යන අතරතුරේදී නිකොළා තුමන් ඇතුළු පිරිස ගමන් ගත් නෞකාව චණ්ඩ මාරුතයක් හමුවේ අනතුරකට මුහුණ පා සිටියදී යාච්ඤා බලයෙන් මාරුතය නිසල කිරීම මෙතුමන්ගේ ජීවිත කාලයේ සිදුවු තවත් එක් විශේෂ සිද්ධියක්.

මෙසේ ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කළ නිකොළා තුමා සෑම දිනකට අළුයම දේවස්ථානයට පැමිණ යාච්ඤා ආරාධනා පැවැත්වීම සිරිතක් කර ගෙන තිබුණා. මේ කාලයේ මිරාන් දේශයේ රදගුරුතුමා ස්වර්ගස්ථ වුයෙන් හිස්වු මෙම උතුම් ධූරයට සුදුස්සෙකු පත් කර ගැනීමට සෙසු රදගුරුතුමන්ලා එක්වී සාකච්ඡා කරද්දී අද්භූත ශබ්දයක හඬ අනාවරණයක් වුනා. පසුදින අළුයම පළමුවෙන්ම දෙව්මැදුරට පැමිණෙන නිකොළා නැමැත්තා ඊට සුදුස්සා බැව් ඉන් පැවසුණා. ඒ අනුව පසුදින ද අළුයම දෙව් මැදුරට පැමිණි නිකොළා තුමා රදගුරු වශයෙන් අභිෂේක කරනු ලබනවා. තම භය හා අකමැත්ත තුළ වුවද දේව කැමැත්තට මෙතුමන් යටත් වුයේ බලවත්ව තමන් තුළ පැවති බැහැපත් භාවය නිසාමයි. මෙතැන් පටන් රාජගුරු ප්‍රසාදි නිකොළා මුනිතුමා දේව මෙහෙයන්ගේ කටයුතු අවසානයෙන් පසු ගම් නියම් ගම්හි ඇවිද අන්‍ය ලබ්ධිකයන්ගේ සිත් පහදවා සත්‍යවු කතෝලික දහම දේශනා කිරීමට පටන් ගන්නවා.

ආදර දුවේ පුතේ, ළදරුවන්ගේ "ආරක්ෂක පියාණෝ" යන විරුදාවලියද සා. නිකොළා මුනිතුමන්ට හිමිවු ගෞරව නාමයක්. මන්ද එතුමන් ළදරුවන් වෙත විශේෂ ආදර කරුණාවක් පෙන්නුම් කළා. බාල දරුවන් තමන් සමීපයට කැඳවා යහපත් මාර්ගයෙහි හැසිරවීමට දයාබර පියෙක් මෙන් කටයුතු කළා. වරක් එතුමන් අහිංසක දුප්පත් ළදරුවන් තිදෙනෙක්ව මරණයෙන් බේරා ගත්තා. රහසින් ළදරුවන්ට තෑගි භෝග දී ඔවුන් සතුටට පත් කලා.

ක්‍රි.ව. 347 දෙසැම්බර් මස 06 වැනි දින පූර්ව භාගයේදී නිකොළා රදගුරුතුමා තම මෙලොව කාලය අවසන් බව දැන "පිරිසිදු මෑණියනි මාගේ මේ මරණ මොහොතේදී මාගේ ආත්මය ඔබගේ පුත්‍රවු ක්‍රිස්තුන් වහන්සේ වෙත ඔප්පු කිරීම පිණිස වැඩිය මැනව" යි යාච්ඤා කරමින් හුස්ම පිටකර ස්වර්ගස්ථ වුණා. ශා. නිකොළා තුමාගේ ස්වර්ගස්ථ වීමෙන් පසු සිදුවු යම් යම් ප්‍රාතිහාර්යයන් හේතු කොට ගෙන ශුද්ධාසනය විසින් නිකොළා තුමන්ව සාන්තුවරයට ඔසවනු ලබනවා.

ආදර දුවේ පුතේ, කුඩා දරුවන්ට අසීමිතව ආදරය කළ ඔවුන් සතුටු කළ මේ සා. නිකොළා මුනිතුමා අද ප්‍රකටව ඉන්නේ නත්තල් සීයා හැටියටයි. නත්තල් සීයා යන්නෙන් අදහස් වන්නේ උතුම් කතෝලික දහමේ සාන්තුවර චරිතයක්. එමනිසා නිතරම නත්තල් සීයා වන මේ සා. නිකොළා මුනිතුමන්ට ගෞරව දක්වන්න කුඩා කළ සිට ඔබත් පුරුදු වන්න. නත්තල් සීයාගේ ස්වරූපය නැති කරන්නට හදන බාහිර ලෝකයේ ක්‍රියාකාරකම් වලට විරුද්ධ වන්න. නත්තල් සමයේ බෙදාහදා ගැනීම් වලට හුරු වන්න. ශා. නිකොළා මුනිතුමන්ගේ ජීවිත ආදර්ශයෙන් මේ බැහැපත් බව ඉගෙන ගන්න.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



# දොන් බොස්කෝ මුනිතුමන්ගේ ප්‍රාතිහාර්යයක්

**දොන් බොස්කෝ මුනිතුමන්ගේ ශුද්ධවු ධාතුව මේ දිනවල ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශණය කෙරේ. ලොව පුරා දොන් බොස්කෝ මුනිදු ප්‍රාතිහාර්යයන් රැසක් සිදුවී ඇත. මෙසේ වු එක් සිදුවීමක් මෙවර ළමා ප්‍රදීපයෙන් ඔබට ගෙනෙමි.**

දොන් බොස්කෝ තුමන් දරුවන්ට ආදරය කළා පමණක් නොව, තම දරුවන්ට සත්‍ය ආදරය පිළිබඳව ඒත්තු ගැන්වීමටද අවශ්‍ය විය. මේ අදහස සනාත කරවන සිදුවීමක් බුරුමයෙන් (මියන්මාරයෙන්) වාර්තාවිය. එනම්, බුරුමය තුළ පවතින හමුදා පාලනය නිසා එහි ආගමික නිදහස ඕනෑම අගමකට ඉතා සීමා වී ඇති බව නොරහසකි. එමනිසා, දොන් බොස්කෝ දේහය බුරුමයට වැඩම කළ මොහොතේ, ජාත්‍යන්තර ගුවන් තොටුපළින් එය පිළිගැනීමට සැදී පැහැදි සිටියේ එරට හමුදාහටයින් පිරිසක් පමණි. දොන් බොස්කෝ තුමන්ගේ අනුගාමි කිසිදු දරුවෙකුට මෙම ගුවන් තොටුපළට ඇතුළු වීමටත් අවසර නොලැබුනි.

නමුත් සිදුවුයේ විශ්මකර්මයකි. එම ශුද්ධවු දේහය ගුවන් යානයෙන් ඉවතට ගැනීමට සුදානම්ව් සිටි හමුදා හටයින් කිහිපදෙනාට එම දේහය අඩංගු මංජුසාව සෙළවීමටත්වත් නොහැකිවිය. එමනිසා එම හටයින් තවත් සද්ධන්ත හමුදා නිළධාරින්ගේ සහය පැතුවද දේහය කිසිසේත්ම එළියට ගැනීමට නොහැකිවිය. එබැවින් තරමක් කේන්තියට පත් ගුවන් තොටුපළේ අණදෙන හමුදා නිළධාරියා (දුරකතනයෙන්) මීළඟට සහය පතා ඇත්තේ ළඟ තිබු දොන් බොස්කෝ සැලේසියානු ආයතනයේ පූජක තමන්ලාගෙනුයි.

තම ආදර පියාණන් වෙත එක් සිත්ව, එක්කොට ගත් ආදර සෙනෙහසක් සමගම ගුවන් තොටුපළ වෙත ගියේ සැලේසියානු පියතුමන්ලා හතර දෙනෙක් පමණි. විශ්ම කර්මය නම් මෙයයි...! එම දේහය අඩංගු මංජුසාව මත මේ දොන් බොස්කෝ තුමන්ගේ දරුවන් හතර දෙනා තම අත් තැබු සැනින්ම එහි සැම විලංගුවක්ම ඇරී කිසිදු බරක් නොමැතිව දේහය තම භාරයට ගැනීමට ඔවුන්ට හැකිවිමයි.

## බොරැල්ල සියලු සාන්තුවර බාලිකා විද්‍යාලීය සිසුවියන්ට ලේඛක වැඩමුළුවක්

ළමුන්ගේ ලේඛන කුසලතා ඔප් නංවාලීමේ අරමුණින් බොරැල්ල සියලු සාන්තුවර බාලිකා විද්‍යාලයේ 9, 10 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුවියන් සඳහා ලේඛක වැඩමුළුවක් මෙම විද්‍යාලයේ දී පැවැත්වේ. දෙසැම්බර් 01 දින පෙ.ව. 9.30 සිට පෙ. ව. 11. 00 දක්වා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. විදුහල්පති ගරු ඇන් ක්‍රිස්ටීන් පැවිදි සොයුරියගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරේ.

**නිර්මාණි චංචලා,**
**12 ශ්‍රේණිය, සියලු සාන්තුවර බාලිකා විද්‍යාලය - බොරැල්ල**

## ළමා ප්‍රදීපය නත්තල් කලාපයට ඔබගේ නිර්මාණ එවන්න.

**ළමා ප්‍රදීපය නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳුණු ළමා ඔබගේ නිර්මාණ (සදැස්, නිසදැස්, ලිපි, චිත්‍ර) අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණයේ ඔබේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, දුරකතන අංකය පැහැදිලිව ලියා එවන්න. ඔබේ නිර්මාණ 2011 දෙසැම්බර් 10 වන දිනට පෙර, පහත ලිපිනයට එවන්න.**

**ළමා ප්‍රදීපය නත්තල් කලාපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**
**සංස්කාරක පියතුමා**

## ළමා ප්‍රදීපය නත්තල් කලාපයේ පිටකවරය සිත්තම් කිරීමට ළමා ඔබටත් අවස්ථාවක් !

**ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපයේ කවරය සිතුවම් කිරීමට, චිත්‍ර ඇඳීමට හපන් ළමා ඔබට අවස්ථාවක් ලබා දීමට අපි තීරණය කළ බැව් සතුටින් යුතුව දන්වමු. ඔබ කළ යුත්තේ නත්තල හා බැඳුනු ලස්සන චිත්‍රයක් දිග සෙ.මී. 24 පළල සෙ.මී. 25 ප්‍රමාණයෙන් ඇඳ පාටකර අප වෙත එවීමයි. ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, දුරකතන අංකය, චිත්‍රයේ පිටුපස සඳහන් කරන්න. ඔබගේ චිත්‍ර දෙසැම්බර් 10 වන දිනට පෙර තැපල් කර හෝ ගෙනවිත් භාර දිය හැකිය.**

**ලිපිනය : ළමා ප්‍රදීපය, නත්තල් කලාපය, පිටකවර තේරිමේ තරගය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

# කතෝලික සසුනේ අවමඟුල් සිරිත් විරිත්



අන් බොහෝ අවස්ථාවල දී මෙන්ම අවමංගල්‍යයන් හිදීත් කතෝලිකයන්ට අනන්‍යවූ චාරිත්‍ර වාරිත්‍ර රැසක් පවතී. ඇතැම් විට සමරහක් කාලයාත් සමග වෙනස්වී තිබිය හැකි අතර ලෝකයේ විවිධ ප්‍රදේශවලට අනන්‍යවූ සිරිත් විරිත් ද තිබිය හැකිය. මළවුන් සමරන මේ මාසයේ ඒ පිළිබඳව කතා කරන්නට මෙවර කිතුනු උරුමය යොදා ගනිමු.

කතෝලිකයකු මිය ගිය විට පහනක් දල්වා තිබීම චාරිත්‍රයකි. මෙය මළ සිරුර තබා ඇති ස්ථානයේ දල්වා තිබේ. මළ සිරුරේ අතේ ජපමාලයක් ඔතා තිබීම සිරිතක් වන අතර ඇතැම් අවස්ථාවල කුඩා කුරුසියක් අතේ තබා ගෙන සිටින අන්දමට මළ සිරුර සකස් කෙරේ. එසේ විශේෂ කුරුසියක් නැති කල ජපමාලයේ ඇති කුරුසිය මිය ගිය අයගේ පපුව මත වැටෙන ලෙස සකස් කිරීමක් ඇකිය හැකිය.

කතෝලික මළ සිරුරට ආසිරි පැන් ඉසීම කතෝලික චාරිත්‍රයයි. අවමංගල්‍ය මෙහෙය දේවස්ථානයේ සිදු කැරෙන අවස්ථාවල් ගිහියකුගේ නම් දෙපා අල්තාරය දෙසට සිටින සේ පෙට්ටිය තබන අතර පියතුමකුගේ නම් හිස අල්තාරය දෙසට සිටින සේ තැබීම කතෝලික සිරිතයි.

කතෝලික අවමංගල්‍යයක දී පිළිපැදිය යුතු වත් පිළිවෙත් හා සසුන් නියමයන් සඳහා විශේෂවූ සංග්‍රහයක් පිළියෙළ කර තිබේ. නිවසේ දී, දේවස්ථානයේ දී හා සුසාන භූමියේ සිදු කැරෙන අවමංගල පිළිවෙත් වෙන් වෙන් වශයෙන් එහි දක්වා ඇති අතර ජනවන්දනා පිළිවෙත්ද ඊට අදාළව එහි දැක්වේ.



**කතෝලියකු මිය ගිය විට අවසාන මෙහෙය දෙව්මැදුරේ සිදු කිරීම කතෝලික සසුන් නියමයයි. කතෝලික සුසාන භූමියක් තිබේ නම් එහි භූමදාන කිරීම ද සාමාන්‍ය සිරිතයි. දෙව්මැදුරෙන් බැහැර පොදු සුසාන භූමි සමරහක වෙනම කතෝලික අංශයක් පවතින විට ඒ කොටසේ කතෝලික මළ සිරුරු භූමදාන කෙරේ.**

කතෝලියකු මිය ගිය විට අවසාන මෙහෙය දෙව්මැදුරේ සිදු කිරීම කතෝලික සසුන් නියමයයි. කතෝලික සුසාන භූමියක් තිබේ නම් එහි භූමදාන කිරීම ද සාමාන්‍ය සිරිතයි. දෙව්මැදුරෙන් බැහැර පොදු සුසාන භූමි සමරහක වෙනම කතෝලික අංශයක් පවතින විට ඒ කොටසේ කතෝලික මළ සිරුරු භූමදාන කෙරේ. කතෝලිකයකුව සිය කැමැත්ත පරිදි වෙනත් සුසාන භූමියක දී වුව භූමදාන වීමට නිදහස ඇතත් කතෝලික නොවන අයකුව කතෝලික සුසාන භූමියක භූමදාන කළ නොහැකිය. කතෝලික අනන්‍යතාවයේ සළකුණු ප්‍රසාද ස්නාපනයයි.

කතෝලික සභාව ආදහන පිළිවෙත පිළි ගන්නා අතර ඊට පෙර මළ සිරුරු තිබිය දී ආගමික චාරිත්‍රයන් ඉටු කළ යුතුවේ. විශේෂයෙන් ආදාහනයේ අරමුණ කතෝලික පිළිවෙත් නිගාවට ලක් කිරීම නොවිය යුතුය. අතීතයේ අවමංගල මෙහෙයයන් සඳහා පියතුමා ඇතුලු සියලු දෙනා කළු පැහැති වස්ත්‍ර යොදා ගත්හ.

එහෙත් කාලයත් සමග ඒ පිළිවෙත් කෙමෙන් වෙනස් වී ඇති අතර විශේෂයෙන් දෙවන වතිකාන කතිකාවෙන් වෙනස් වී ඇති අතර විශේෂයෙන් දෙවන වතිකාන කතිකාවෙන් පසු ඒ පරිණාමය සිදු විය. කෙසේ වෙතත් කළු කොඩිය, කළු ඇඳුම් පැළඳුම් තවමත් කතෝලික අවමංගල්‍ය හඟවන නිහඬ සාක්ෂි වැන්න. එහෙත් කළු පැහැ ඇඳුම් ඇඳීම නූතන විලාසිතාවක් වී ඇති කලෙක කළු ඇඳ ගත් කෙනෙකු දුටු පමණින් "මළ ගෙයක් දැයි" කියා අහන්න එපා හොඳේ.

ශිරාන් මෛත්‍රී




# යාච්ඤාවේ බලගතු බව



දෙවි පියාණන් වහන්සේ ලාබන්ගෙන් ජාකොබ්ව මුදවා ගත් ආකාරය පසුගිය ලිපියෙන් පැහැදිලි කලා ඔබට මතක ඇති.

තම සහෝදරයා වන ඒසව් රවටා, ආශිර්වාදය ලබා ගෙන ගෙදරින් පැන ගිය ජාකොබ්, වසර ගණනාවකට පසු නැවත තම ගම්බිම් බලා පැමිණෙන්නට තීරණය කළේය. ඒසව් ඔහුගෙන් පළි ගනී කියා ඔහු තුළ මහත් බියක් ඇති විය. මෙහිදි ඔහු විශ්වාසය තැබුවේ දෙවිඳුන් තුළයි. ඔහුගේ බිය නැති කරන ලෙසත්, ඒසව්ගේ සිත වෙනස් කරන ලෙසත් ඔහු මෙසේ යාච්ඤා කළේය.

" මා ප්‍රිය ආබ්‍රහම්ගේ දෙවිඳුනි, මා පිය වූ ඊසාක්ගේ දෙවිඳුනි ඔබේ දේශයට ද, ඔබේ ඥාතින් වෙත ද ආපසු යන්නට..මගේසහෝදරයාගේ බලයෙන් ඒසව් ගේ අතින් මා මුදාගතමැනව. (උත්. 32/9-12)

ජාකොබ් ඔවුන්ට පෙරටුව ගොස් තම සොහොයුරා වෙත පැමිණෙන තෙක් සත් වරක් බිමට වැන්දේය. එවිට ඒසව් හමුවීමට දිව ගොස් ඔහු බදාගෙන ඔහුගේ ගෙළ වැළඳ ගෙන ඔහු සිඹ ගත්තේය.... (උත් 33 /3-4)

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය විසිනි.

සහෝදරයන් දෙදෙනා අතර ඇතිවූ ආරවුල නිසා ඒසව් පසුවූයේ තරහෙනි. ක්‍රෝධය හා පළිගැනීමේ චේතනාවෙනි. ඔහුගේ හිතේ වෛරය ගිණි දළු මෙන් පුපුරු ගසමින් තිබිණි. එබැවින් හිත තුළ සාමය, සතුට නැත. සිත සැමවිටම නොසන්සුන්ය.

නමුත් ජාකොබ්ගේ යාච්ඤාව තුළින් ඒසව්ගේ සිත සුවපත් විය. අවසානයේ දී ඒසව් ද සාමකාමි ධර්මිෂ්ඨයකු බවට පත් විය.

ආදර දරුවනි යාච්ඤාව මොනතරම් බලගතු ද කියා ඔබට පේනවා නේද ? ඔබත් ජාකොබ් මෙන් සිත තුළ වෛරය, ක්‍රෝධය, තරහව, පළිගැනිමේ චේතනාවෙන් සිටින අන් අයගේ සිත් වෙනස් කර ධර්මිෂ්ඨ පුද්ගලයෙක් කරන්න කියා දෙවිඳුන්ට දිනපතාම යාච්ඤා කරන්න. එමෙන්ම ඔබත් ධර්මිෂ්ඨ පුද්ගලයකු ලෙස දෙවිඳුන් හා විශ්වාසයෙන් ගමන් කරන්න.

**වැඩිදුර දැන ගැනීම පිණිස උත්පත්ති පොතේ 32, 33 පරිච්ඡේද කියවන්න.**

ජාකොබ්ගේ යාච්ඤාව තුළින් ඒසව්ගේ සිත සුවපත් විය. අවසානයේ දී ඒසව් ද සාමකාමි ධර්මිෂ්ඨයකු බවට පත් විය.
ආදර දරුවනි යාච්ඤාව මොනතරම් බලගතු ද කියා ඔබට පේනවා නේද ? ඔබත් ජාකොබ් මෙන් සිත තුළ වෛරය, ක්‍රෝධය, තරහව, පළිගැනිමේ චේතනාවෙන් සිටින අන් අයගේ සිත් වෙනස් කර ධර්මිෂ්ඨ පුද්ගලයෙක් කරන්න කියා දෙවිඳුන්ට දිනපතාම යාච්ඤා කරන්න. එමෙන්ම ඔබත් ධර්මිෂ්ඨ පුද්ගලයකු ලෙස දෙවිඳුන් හා විශ්වාසයෙන් ගමන් කරන්න.



## මාසික සිතිවිල්ල

සේයා :
ටී. සුනිල් ප්‍රනාන්දු

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, "නොවැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ ළමා ප්‍රදීපයේ පළ කෙරේ**

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය**

**කතෝලික ධර්මය** II **(පැය දෙකයි)**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
   1. ජලයෙන් බෞතිස්මය නොලැබුවත් දේව රාජ්‍යයට පිවිසෙන අය දෙපිරිසක් නම් කරන්න.
   2. පොදු පූජකවරය තුළින් ක්‍රිස්තන් වහන්සේගෙන් ගිහියා ලබා ඇති එඬේරික කාර්යයන් දෙකක් ලියන්න.
   3. තේවාචාර්යතුමකුගේ කාර්යයන් දෙකක් ලියා දක්වන්න.
   4. ජපමාලය උච්චාරණය කරන විට වික්ෂෝප අභිරහස් ගැන මෙනෙහි කරන දවස් දෙක නම් කරන්න.
   5. යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී" යන්න කවුරුන්ගේ අදහසක්ද ?
   6. ස්වර්ගයෙහි වැඩ සිටින යැදුම වෙනුවෙන් ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ලියූ ගීතිකාව කුමක්ද ?
   7. අසල්වැසියන්ට ප්‍රේම කිරීම සඳහා අප විසින් කළ යුතු ප්‍රධාන පුන්‍ය ක්‍රියා දෙවර්ගය නම් කරන්න.
   8. ජනවන්දනාවේ උතුම්ම පිළිවෙත කුමක්ද ?
   9. දිව දමනය පිළිබඳව විශේෂ ඉගැන්වීමක් සිදු කරන නව ගිවිසුම් ලේඛකයා කවුද ?
   10. "පියාණෙනි, ඔබ මට සවන් දුන් නිසා මම ඔබට ස්තුති කරමි" යනුවෙන් ජේසුස් වහන්සේ පවසන්නේ කුමන අවස්ථාවේ ද ?

02. 1. තෝරාගත් ජනතාවගේ පියා වශයෙන් ආබ්‍රහම් කැඳවූ දෙවියන් වහන්සේ ඔහුට දුන් පොරොන්දු දෙකක් ලියා දක්වන්න.
   3. ආබ්‍රහම් දෙවියන් වහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයක් තැබූ බවට නිදසුන් තුනක් ඉදිරිපත් කරන්න.
   4. පාසලේ කුඩා දරුවන් යහමග යැවීමේ නායකත්වයක් ඔබට පැවරී ඇත. ඔබ එම නායකත්වයට සාක්ෂි දරන ආකාරය ප්‍රධාන අදහස් පහක් ඇසුරින් විස්තර කරන්න.

03. 1. ශ්‍රී ලංකාවට පෘතුගීසි යුගයේ දී පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.
   2. ලන්දේසීන් විසින් කතෝලිකයන්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති තුනක් ලියා දක්වන්න.
   3. ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ ක්‍රියාකාරී අවයවයක් වශයෙන් ඔබට පැවරී ඇති කාර්යයන් පහක් කෙටියෙන් විස්තර කරන්න.

04. 1. ශුද්ධ වූ අගුස්තීනු තුමා පාපෝච්චාරණය හෙවත් සමගි සන්ධානයේ ප්‍රසාද නිධානයට භාවිත කළ නම කුමක්ද ?
   2. සමගි සන්ධානයේ දෙව් ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් පසු පාසල් සිසුවකු වශයෙන් ඔබ තුළ ඇති විය යුතු වෙනස්කම් තුනක් ලියන්න.
   3. "ජේසුස් වහන්සේ පව්කරුවන්ට අසීමිතව ප්‍රේම කළ සේක. සමාව දුන් සේක. එය එසේ වුව ද වර්තමාන සමාජය තුළ එකිනෙකාට සමාව දානය කිරීම දක්නට නොලැබේ. මේ සඳහා හේතු වන්නට ඇතැයි සිතන කරුණු පහක් පැහැදිලි කරන්න.

5. 1. ස්නාවක ජොහාන් තුමා එදා සමාජයට ඉදිරිපත් කළ සාරධර්ම දෙකක් ලියන්න.
   2. කතෝලිකයන්ට ම ආවේනික වූ සාරධර්ම පිළිබඳව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුනක් පෙන්වා දෙන්න.
   3. හත්වැනි සහ දසවැනි දේව පණත් පදනම් කරගෙන අද මෙරට සමාජයට මතක් කර දිය යුතු සාරධර්ම පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. 1. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා දෙකක් සඳහන් කරන්න.
   2. යාච්ඤාව පිළිබඳව ජේසුස් වහන්සේ වදාළ උපමාවක් නම් කර, එයින් ලැබෙන මග පෙන්වීම් දෙකක් නම් කරන්න.
   3. ඔබ ක්‍රියාකාරී ලෙස ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වන ආකාරය ප්‍රධාන කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
   1. භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා
   2. ස්වාමින් වහන්සේගේ දිනය
   3. මාගේ දිවැසිවර සේවාව
   4. වගකීම් ඉටු කළ තෙරේසා මව්තුමිය.

**පිළිතුරු ලබන සතියේ**

**සැකසුම**

**කතෝලික අධ්‍යාපන සේවාව - අනුරාධපුර රදගුරු පදවිය**

## සිඟිති කථා





# හා පැටවුන්

එදා හා පැටවුන් දෙදෙනා ගෙනා දවස මට අද වගේ මතකයි. නංගීගේ මුහුනේ මතුවූ සිනා රැල්ල කොතරම් චමත්කාර ද "අනේ අයියේ බලන්නකෝ මේ දෙන්නාගේ ලස්සන හරියට සුදු පුළුන් ගොඩවල් දෙකක් වගේ."

හා පැටවුන් ඇය තුරුලු කර ගන්නට හදන විට මා උන් උදුරා ගෙන කූඩුව වෙතට ගෙන ගියේ හිත් පිත් නැති අයෙකු ලෙසිනි. පුංචි කූඩුව ඇතුලට දැමූ පසු උන් ඒ මේ අත දුවන අයුරු නංගී බලා සිටියේ හරිම ආසාවකිනි.

"අයියේ උන්ට කිරි දෙන්නේ නැද්ද ? නෑ මෝඩියේ උන්ට කිරි දෙන්නේ නෑ. උන් දැන් මාස තුනක විතර පැටව්නේ."

"දැන් උන්ට කන්ඩ දෙන්නෙ මොනවාද ? කියමින් නැවත නැවත ප්‍රශ්න කරන්නේ උන් ගැන ඇති වූ ආදරේකින් යැයි මට සිතේ. "උන්ට එරබදු කොල, උදුපියලි කන්කුන් දෙන්ඩ ඕන." " එරබදු ගස් අපේ වත්තේ නැනෙ අයියෙ" කියා හදිසියේ යමක් කල්පනා වූ කලෙක මෙන් වත්ත පහලට දිව ගියේ හරිම වේගයකිනි. ඉතා ඉක්මණින් ඇය පැමිණියේ එරබදු කොල රාශියක් කඩා ගෙනයි. "කොහෙන්ද මේ එරබදු කොළ ?" "අපේ වත්තේ නැති හින්දා අල්ලපු වත්තට ගිහිල්ලා කඩා ගෙන ආවා.

එදා සිට ඈ නිතරම හා කූඩුව ළඟ ගැවසෙමින් උන්ට උවමනා කැම සොයා දෙයි. උන් දිහා බලමින් "අනේ උන් කනහැටි බලන්ඩකෝ හරියට මැෂින් එකක් වගේ. අනේ එකෙක් අනික් එකාගේ කටේ තියන එරබදු කොල උදුරාගෙන කැවා." මේ ආදි දේ කියමින් ඈ නිතරම දොඩමළු වෙයි.

මෙවිට අම්මා "මේ මොන කරදරයක්ද මන් දැන් උන්ව කාට හරි දෙනවා" යයි කියන විට නංගී කේන්තියෙන් ම "හා මන් දෙනවා ගෙනියන්න මං ඉන්නකන් කාටවත් අල්ලන්වත් දෙන්නේ නෑ" යයි පවසන්නේ හිතේ ඇතිවූ තරහවකින්ම යයි කිව හැක.

ඇය සැමදා උදේට පාර බලා සිටි පාරේ යන කීර කාරයින් ගෙන් කංකුං ගන්නේ අම්මාට ද නොයෙක් වර කරදර කරමිනි.

සතියක් ඉක්ම ගිය බවක් තම නංගීට නොදැනෙන්ට ඇත්තේ හා පැටවුන් නිසා යැයි සිතිය හැක. එක් ඉරිදා උදෑසනක මා හා කූඩුව වෙත පිය නගන්නට පටන් ගත්තේ නිතැතිනි. දෙනෙත් අදහා ගත නොහැකි විය. හා කූඩුවේ දොර කඩා දමා තිබුණි. හා පැටවුන් දෙදෙනාම අතුරුදහන් වී ඇත. මෙය සොරෙකුගේ වැඩක් යයි සිතා ගත් මා ප්‍රථමයෙන් ම මවටද ඉන්පසුව නිදි යහනේ සිටි නංගිට ද කූද්දා මෙය කීවෙමි.

එවිට ඈ නිදි ගැට කඩමින් නැගිට "අයියා හැම තිස්සේම බොරු කියනවා. මාව රවට්ටන්ඩ" යයි කියමින් සැනෙකින් කූඩුව වෙත දිව ගියාය. කාරණය තේරුම් ගත් ඇගේ නෙත් කඳුලින් පිරි යනු දුටු මම ඉමහත් සංවේගයට පත්විමි.

**තෝමස් සේනාධීර**

# මට ආසයි

පිනිබිඳුවල පහස ලබා පාන්දරින් අවදි වෙන්න.
වික සිත මුව පෙන්නාලා මුහුණ පුරා සිනාසිලා
කාගෙත් සිත් තුටු කරන්න. ආසයි මට මලක් වෙන්න

බමර පැටවි සමනලයින් ළංවී මගෙ සිරි බලන්න
පොර කනවා බලා ඉන්න ආසයි මට මලක් වෙන්න.

පුංචි ළමෝ වට වීලා මොළකැටි දෝතට අරගෙන
අගය කරන හැටි බලන්න ආසයි මට මලක් වෙන්න

පිවිතුරු කම චාම් ගති මා ළඟ හොඳටම තිබේලු
එහෙම කෙනෙක් වගේ වෙන්න ආසයි මට මලක් වෙන්න.

නිරතුරුවම ළඟට වෙන්න ජේසුගේ පාමුලට යන්න
අසිරි ලබා සැන සෙන්නට ආසයි මට මලක් වෙන්න.

**ඇල්ප්‍රඩ් නෙල්සන්**

# විශ්ව දින පොත

## දෙසැම්බර් 01 - ලෝක ඒඩ්ස් දිනය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් 1988 දෙසැම්බර් 01 වන දින පළමුවරට ලෝක ඒඩ්ස් දිනය ප්‍රකාශයට පත් කරන ලදි.

ඒඩ්ස් රෝගී තත්ත්වයට මුල්වරට හඳුනා ගන්නා ලද්දේ 1981 ජුනි මස 05 වන දින ඇමෙරිකා එක්සත් ජනපදයේ රෝහල් වල ප්‍රතිකාර ගත් සමලිංගික තරුණ පිරිමි රෝගීන් කිහිප දෙනෙකු ඇසුරින් කරන ලද පරීක්ෂවලිනි. ඒඩ්ස් රෝගයට හේතුකාරක HIV වන වෛරසය පළමු වරට සොයා ගැනීමේ ගෞරවය හිමි වන්නේ, ප්‍රංශයේ පාස්චර් ආයතනයේ ලූක් මොන්ටෙග්නියර් නමැති වෛරස විශේෂඥයාටය. 1984 වසරේ දී ඇමෙරිකාවේ. රොබට් ගැලෝ විසින් ද මෙම වෛරසය ම සොයා ගන්නා ලදි.

ඒඩ්ස් රෝග ඇති කරනුයේ මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය ශරීර ගත වී වසර 2-15 පමණ කාලයක් වුවද නිරෝගී අයකු ලෙස සමාජයේ ගැවසීමටත්, අන් අයටත් බෝ කිරීමටත් ඉඩ තිබේ. මෙම වෛරසය ශරීර ගත වූ අයගෙන් 95% ක් තුළ රුධිරයෙහි ප්‍රතිදේහ ඇතිවන්නට ගත වන්නේ මාස 03 ක කාලයකි.

## දෙසැම්බර් 05 ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර ස්වේච්ඡා දිනය

1985 දෙසැම්බර් 17 වන දින යෝජනා අංක 55/199 යටතේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩය විසින් සෑම වරසකම දෙසැම්බර් 05 වන දින ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර ස්වේච්ඡා දිනය ලෙස නම් කරන ලදි.

ස්වේච්ඡා සේවා දයාකත්වය පිළිබඳ දැනුවත් කිරීම සහ හැකියා මට්ටමෙන් තම රටේ දී සහ ජාත්‍යන්තරව අන් අයට සහයෝගය දැක්වීම අරමුණු කර ගනිමින් මෙම දිනය ක්‍රියාත්මක වෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ජාත්‍යන්තර ස්වේච්ඡා සේවක වර්ෂය (International Year of Volunteers) ලෙස වසර 2001 නම් කරන ලදි.

## දෙසැම්බර් 07 - ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා දිනය




එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1996 වසරේ දී දෙසැම්බර් 07 වන දින, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා දිනය ලෙස නම් කෙරිණි. මෙම දිනය දේශීය - ප්‍රාදේශීය - ජාත්‍යන්තර - අන්තර් රාජ්‍ය සංවිධානවලට සමරන ලෙස මහා මණ්ඩලය ඉල්ලා සිටියි. ජාත්‍යන්තර ගුවන් යානා සඳහා කාලගුණ දත්ත රැස්කිරීම, ගුවන් නීතිරීති විධිමත් කිරීම මෙම සංවිධානයේ අරමුණු වන අතර, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා දිනයේ දී මෙම අරමුණු කෙරෙහි ජනතා අවබෝධය යොමු කරයි.

## දෙසැම්බර් හෙවත් උඳුවප්

උඳු: වප් යනු වියළි - බීජ (බෝග) වන අතර, වියළි බෝග හෙවත් මාංශ බෝග, උඳු- මුං යනාදිය වගා කිරීමට සුදුසුම කාලය යන අර්ථය ඇතිව “උඳුවප්” යන නාමය මෙම මාසයට එක්විය. ලතින් භාෂාවෙන් ශුද්ධවූ මාසය යන අර්ථය ඇති “ඩිසෙම” අනුව, December හෙවත් දෙසැම්බර් යන නමින් මෙම මාසය හැඳින්වේ.

සිවිල් ගුවන් සේවා සංවිධාන මහා සම්මේලනය විසින් 1992 වසරේ දී මෙම දිනය ප්‍රකාශයට පත් කරන ලද්දේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා කටයුතු සහ ප්‍රයෝජන පිළිබඳ දැනුවත් කිරීම අරමුණු කරගෙන 1994 දෙසැම්බර් 07 වන දින මෙම දිනය ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය ආරම්භ කරන ලද්දේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතිය අත්සන් කර 50 වසරක් පිරීම නිමිති කරගෙනය. ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ආරාධනාවක් පරිදි රටවල් 54 ක සහභාගිත්වයෙන් චිකාගෝ හි 1944 වන වසරේදී රැස්වී මෙම සංවිධානය පිහිටුවා ගන්නා ලදි. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ගුවන් ගමන් පිහිටුවීම, ගුවන් යානා නඩත්තුව,

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලේ ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි

## දෙසැම්බර් 18 ජාත්‍යන්තර සංක්‍රමණික දිනය




එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු මහා මණ්ඩලය සෑම වසරකම දෙසැම්බර් 18 වන දින ජාත්‍යන්තර සංක්‍රමණික දිනය ලෙස නම් කෙරිනි.

ඉතිරිය 14 පිටුවේ

# මොරටුව කටුකුරුන්ද මීසමේ දහම් දරුවන්ට ලේඛක වැඩමුළුවක්



මොරටුව කටුකුරුන්ද සාන්ත මරියා හා මෝදර හා. ජුසේ වාස් දහම් පාසලේ ළමුන් සඳහා ලේඛක වැඩමුළුවක් පසුගිය දා මොරටුව කටුකුරුන්ද සාන්ත මරියා දහම් පාසල් ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණි. ළමා ලේඛන හැකියාවන් ඔප් නංවාලීමේ අරමුණින් හා ළමා ප්‍රදීපය පුවත්පත ළමුන් අතර ජනප්‍රිය කරලීමේ බලාපොරොත්තුවෙන් මෙය පැවැත් වුනි. ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් මෙය මෙහෙය විය. මෙහි දී ජනසංනිවේදනය, පුවත්පත් කලාව හා නිර්මාණකරණය පිළිබඳව ළමෝ දැනුවත් කළහ.

මෙයට එක්ව ළමුන්ට නිර්මාණ අභ්‍යාසයක් ලබා දී, ඉන් ජයග්‍රාහී නිර්මාණයන් ළමා ප්‍රදීපය පුවත්පතේ පල කිරීමට, අවස්ථාව ලබා දීම. ළමුන්ට ලැබුණු සුවිශේෂි අවස්ථාවකි. මෙදින ළමා ප්‍රදීපය මාසික සිතුවිල්ල විශේෂාංගයේ ඔක්තෝබර් මස ජයග්‍රහණය ලැබූ කටුකුරුන්ද සාන්ත මරියා දහම් පාසලේ 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සඳුෂා ප්‍රනාන්දු දැරියට දේශක මහතා විසින් ත්‍යාගයක් ලබා දීම ද විශේෂත්වයකි. මෙහි ආරම්භක අවස්ථාවට මීසම් සේවක ගරු ක්‍රිෂන්තස් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමා හා දහම් ගුරුවරුන් සහභාගි වුණි. කටුකුරුන්ද මීසමේ ධර්මදූත සජීවකයෙකු වන අසික ප්‍රියදර්ශන මහතා විසින් ධර්මදූත ළමුන්ගේ සහය ඇතුව මෙම ළමා ලේඛක වැඩමුළුව සාර්ථකව සංවිධානය කෙරෙනි.



වැඩමුළුව මෙහෙයවන දේශක කුමර නයනජිත් මහතා සහ පුවත්පත් කලාව පිළිබඳව දෙසුම අවස්ථාවේදී ළමුන් ප්‍රායෝගික අභ්‍යාසයකට සහභාගී වන අයුරු.

**සේයා - අසික ප්‍රියදර්ශන**
**සටහන - ප්‍රමෝදිකා අපෝන්සු, රවින්දි ප්‍රනාන්දු**
**(ධර්මදූත ළමා සමාජය)**

# කඩලාන දහම් ගුරුවරු උපහාර ලබති

මොරටුව, කඩලාන සා. අන්තෝනි දහම් පාසල් ශිෂ්‍ය නායක සංගමය හා දෙමාපිය සංගමයේ සංවිධානයෙන් දහම් ගුරු උපහාර උළෙලක් පසුගියදා පැවැත්විනි. කොළඹ අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රරතන්සිරි ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙයට එක්වූ මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමන් විසින් පහන් වැටියක් දල්වන ආකාරය ඡායාරූපයේ දැක්වේ. ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු පියතුමා සහය මීසම් සේවක ගරු මලින්ත චතුරංග පියතුමා, දහම් පාසල් විදුහල්පතිනි ගරු මියුරියල් වික්‍රමරත්න පැවිදි සොහොයුරිය ද ඡායාරූපයේ වෙති.

**(ක්‍රිෂාන්ති ක්ලෙයා - කඩලාන )**



# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 34

### යමෙකුට යමක් අයිති බව අඟවන හැටි

අපි යම් කෙනකුට හෝ දෙයකට යමක් අයිති බව අඟවන විදිහ ඉංග්‍රීසියෙන් ලියන හැටි ඊළඟට බලමු.

බලන්න මේ යෙදුම් දිහා :-

Sunimal**'s** book - (සුනිමල්ස් බුක්) - සුනිමල්ගේ පොත
Dog**'s** tail - (ඩෝග්ස් ටේල්) - බල්ලාගේ වලිගය
Kamani**'s** mother - (කමනිස් මද(ර්)) - කමනිගෙ අම්මා

මෙන්න මේ විදිහට "යම් කෙනකුගේ" කියන අදහස දැක්වීමට අපි යොදාගන්නේ **' සහ S** අකුරයි. නමුත් මෙම ' ලකුණ (apostrophe - ඇපොස්ට්‍රොෆි) සහ S අකුර යෙදෙන විදිහ සහ තැන් නිවැරදිව ඔබ දැන සිටිය යුතුයි.

සාමාන්‍යයෙන් මිනිසුන්ට සහ සතුන්ට අයිති දෙයක් ගැන කීමට අපි මෙහෙම ඒ පුද්ගලයා හෝ සත්වයාට කියන නම ආලා ඊට පසුව ( ' සහ S) යොදනවා.

| | | |
|---|---|---|
| The elephant's tusks | - | අලියාගේ දළ |
| The driver's key | - | රියදුරාගේ යතුර |
| My Friend's room | - | යාළුවාගේ කාමරය |
| Mr. Perera's daughter | - | පෙරේරා මහතාගේ දුව |
| The child's toy | - | ළමයාගේ සෙල්ලම් බඩුව |
| Manager's office | - | කළමනාකරුගේ කාර්යාලය |

සමහර විට මිනිසුන්ට අයිති දේ කීමට අපි තවත් ක්‍රමයක් පාවිච්චි කරනවා. "Of the" තියන වචන සහිතව ඒ දේ කියන්න පුළුවන්.

The name of the man standing there...
(ද නේම් ඔෆ් ද මැන් ස්ටෑන්ඩිං දෙයාර්...)
අතන සිටගෙන ඉන්න මිනිසාගේ නම...

The duty of the parents.... - (ද ඩියුටි ඔෆ් ද පේරන්ට්ස්)
මව්පියන්ගේ යුතුකම....

The behaviour of students... - (ද බිහේවියර් ඔෆ් ස්ටුඩන්ට්ස්)
සිසුන්ගේ හැසිරීම ... යනාදි වශයෙන්

ඇතැම් අවස්ථාවලදී අපට "of the" යන වචන උපයෝගී කරගෙන අයිතියක් ගැන සඳහන් කරන්න පුළුවන්. සමහර අවස්ථාවල දී මිනිසුන්ගේ පමණක් නොව, දේවල් සහ අදහස් වලට අයිතිබව කීමටත් අපි "of the" යොදා ගන්නවා.

The legs of the table
මේසෙ කකුල් (ඒත් Table's legs කියන්නෙ නෑ)

The roof of the kitchen
කුස්සියේ වහල (The kitchen's roof කියන්නෙ නෑ)

The owner of the shop
සාප්පුවේ අයිතිකරු (Shop's owner කියන්නෙ නෑ)

Name of the book
පොතේ නම (Book's name කියන්නෙ නෑ)

The begining of the month - (ද බිගිනින්ග් ඔෆ් ද මන්ත්)
මාසේ මුල (month's begining කියන්නෙ නෑ)

Back of the car - (බැක් ඔෆ් ද කාර්)
කාරෙකේ පසුපස (Car's back කියන්නෙ නෑ)

ඒත් සමහර අවස්ථාවලදී "Of the" හෝ (' S) හෝ නැතුව නාම පද දෙකක් ඇසුරු කරගෙනත් අපි අයිතිකමක් ගැන කියනවා.

The garage door (garage, door) කියන වචන දෙකම නාම පද. එත් මේ දෙක එක් කරලා "ගරාජයේ දොර" කියන අදහස ප්‍රකාශ කළ හැකියි.

The shop owner - සාප්පුවේ අයිතිකරු. ඒකත් ඒ වගේ.
The door lock - දොරේ අගුල,
Shoe lace - සපත්තුවේ ලේස් එක යනාදියත් ඒ වගේ භාවිතා වන වචන.

සමූහයක් වශයෙන් භාවිතා වන ඇතැම් නාම පද භාවිතා කිරීමේදී
අපිට ( 's) යොදන්න පුළුවන්.

The company's success - සමාගමේ සාර්ථකත්වය
Government 's decision - රජයේ තීරණය
එහෙම නැත්නම් The success of the company
The decision of the government කියල යොදන්නත් පුළුවන්.

ඉංග්‍රීසියෙන් යම්කිසි දේකට හෝ කෙනකුට යමක් අයිති බව අඟවන හැටි අපි කතා කළා.
"S" (Apostrophe (') සහ S යොදන හැටිත් "of the" යොදන හැටිත් නාම පද දෙකක් එකතු කිරීමෙන් අයිතිය හඟවන හැටිත් අපි ඉගෙන ගත්තා.
සමහර අවස්ථාවලදී සමහර දේවල් පිළිබඳ අයිතිය ගැන මේ ක්‍රම තුනෙන්ම ලියන්න පුළුවන්.
**නිදසුන්:-**
"ලෝකේ ජනගහනය" කියන එක අපිට ඒ ක්‍රම තුනෙන්ම ලියන්න පුළුවන්. මේ විදිහට

1) The world's population.
2) The population of the world.
3) The world population.

**තව නිදසුනක්: නගරයේ නව සිනමාහලː**

1. The city's new cinema.
2. The new cinema of the city.
3. The new city cinema.

අපි දැන් බලමු බහුවචන නාම පදවලට අයිති බව හඟවන හැටි කොහොමද කියන්නෙ කියල. බහු වචන බොහෝමයක් S වලින් ඉවරවෙන බව ඔබ දන්නවා.
නිදසුන්: boys - (පිරිමි ළමයි), girls (ගැහැණු ළමයි), cats (බළල්ලු), chairs (පුටු), Tables (මේස) යනාදි වශයෙන්.
ඒ වගේ සමහර නාම පද වෙනත් විධිවලිනුත් බහුවචන බවට පත්වෙලා තියෙනවා.
**නිදසුන්:**
women (ගැහැණු), Children (ළමයි), men (මිනිස්සු), deer (මුවෝ), aircraft (අහස් යානා) යනාදි වශයෙන්.
අපි කලින් පාඩමක මෙම ඒක වචන - බහුවචන වන හැටි ඉගෙන ගත්තා ඔබට මතක ඇති. ඉහත සඳහන් "S" අකුරෙන් කෙළවර වන නාමපදවලට අයිතිය ඇඟවීමට අපි apostrophe (') S අකුරට පස්සෙ යොදනවා.
ඒක වචන වලට යොදන්නෙ **"S" අකුරට කලින් බව ඔබ දැක්කා. නමුත් බහු වචන වලට apostrophe යොදන්නෙ S අකුරට පස්සෙ බව නැවත අවධාරණය කරගන්න.**
නිදසුන්:

| ඒක වචන | බහු වචන |
|---|---|
| 1. Boy's bag<br>පිරිමි ළමයාගේ බෑග් එක | Boys' school<br>පිරිමි ළමයින්ගේ පාසල |
| 2. My sister's room<br>මගේ සොයුරියගේ කාමරය | My sisters' rooms<br>මගේ සොයුරියන්ගේ කාමර |
| 3. My friend's car<br>මගේ මිතුරාගේ කාරෙක | My friends' houses<br>මගේ මිතුරන්ගේ ගෙවල් |
| 4. The elephant's trunk<br>අලියාගේ හොඬවැල | The elephants' trunks<br>අලින්ගේ හොඬවැල් |
| 5. Mother's love<br>අම්මාගේ ආදරය | Mothers' meeting<br>අම්මලාගේ රැස්වීම |

ඒ වගේම "S" අකුරෙන් බහුවචන වලට පත්වී නැති අනිත් වචන වලටත් අපි "S" යොදනවා. Apostrophe (')එකත් යොදනවා. **ඒ යොදන්නේ "S" අකුරට පිටුපසින් නෙමේ. ඉදිරියෙන් බව අවබෝධ කරගන්න.**

| ඒක වචන | බහු වචන |
|---|---|
| 1. The child's mother<br>ළමයාගේ මව | The children's toys<br>ළමයින්ගේ සෙල්ලම් බඩු |
| 2. The man's shirt<br>අර මිනිහගේ කමිසෙ | Those men's shirts<br>අර මිනිසුන්ගේ කමිස |
| 3. The woman's handbag<br>කාන්තාවගේ අත්බෑගය | The women's gossip<br>ගැහැණුන්ගේ ඕපාදූප කතාව |
| 4. The deer's horns<br>මුවාගේ අං | The deer's horns<br>මුවන්ගේ අං |

දෙදෙනෙක් එක්කරලා බහුවචන ස්වරූපයෙන් යෙදුවොත්, Apostrophe (') සහ (S) යොදන්නෙ දෙවැනි නාම පදයටයි.
**නිදසුන්:**

Anil and Kamala's wedding
අනිල් සහ කමලාගේ මඟුල් උත්සවය

Sirisena and Gunapala's shop.
සිරිසේනගේ සහ ගුණපාලගේ සාප්පුව

ඉහත සඳහන් වන්නේ දෙන්නාටම අයිති දෙයක් ගැන කියන හැටියි. වෙන් වෙන්ව දෙදෙනකුට අයිති දෙයක් ගැන කීමේදී, මුලින් වගේ Apostrophe එකට පසු පසින් "S" යෙදිය හැකිය.

Ranjith's and Ranjan's exam results
රංජිත් ගේ සහ රන්ජන්ගේ විභාග ප්‍රතිඵල.

Kamala's and Jeewa's parents
කමලාගේ මව්පියෝ සහ ජීවාගේ මව්පියෝ

ඉංග්‍රීසියේදී Apostrophe සහ S යොදා වෙනත් අදහසක් ප්‍රකාශ කරන අවස්ථාවනුත් තියෙනවා. මේ වැකි දිහා බලන්න.
I am going to the doctor's.
අයැම් ගොයිං ටු ද ඩොක්ටර්ස්
ඒකෙන් කියන්නෙ...
මම වෛද්‍යවරයා හමුවන්න යනවා කියන එකයි.
(doctor's house, doctor's place..... වගේ)
වෛද්‍යවරයාට අයිති තැනකට යනවා කියන අදහස.
My sister has gone to Kamala's.
මයි සිස්ටර් හැස් ගෝන් ටු කමලාස්
ඒකෙ තේරුම - මගේ සොයුරිය "කමලලාගේ ගෙදර" ගිහින් කියන එකයි.

On my way I went to my uncle's.
ඔන් මයි වේ අයි වෙන්ට් ටු මයි අන්කල්ස්
ඒකෙ තේරුම - මම එද්දි "අන්කල්ලගෙ" ගෙදරත් ගියා කියන එකයි. (අන්කල්ගෙ ගෙදර Uncle's house) කියන අදහසයි ඉන් කියැවෙන්නේ.

## සාතන් පරාජය කරමු



**කේ.එම්. ඩිල්ෂාන් විරාජ්**
8 ශ්‍රේණිය,
සා.අන්තෝනි දහම් පාසල,
දුනකදෙණිය.

## ආදම් සහ ඒව



**සමීනා රනුෂී**
3 ශ්‍රේණිය,
ජයලත් අප ස්වාමි දූ ගේ කන්‍යාරාමය
මොරටුව

## දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය



**නෙත්මි විශ්මිණී**
5 ශ්‍රේණිය,
සා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල,
හලාවත.

### පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## මල් මෝස්තරයක්



**ආර්.කේ.ඩී. සිත්මි දිනේත්‍රා**
2 ශ්‍රේණිය,
සෙනරත් ක. විද්‍යාලය,
මිදෙල්ලවිට

## ඉර බැස යන සැන්දෑවක්



**මේරීන් ෂවීනා ලියනගේ**
2 ශ්‍රේණිය,
ශු. ඌගෝ මුනිඳුන්ගේ දහම් පාසල,
බුරුල්ලපිටිය.

## අපේ පල්ලිය



**දිමුතු සෙනාල්**
1 ශ්‍රේණිය, පාතිමා මාතා දහම් පාසල,
යායමුල්ල.

## පරිසරයට ආදරය කරමු



**හංසිකා විශ්මි පෙරේරා**
5 ශ්‍රේණිය,
ලූර්දු මාතා දහම් පාසල,
තේවත්ත.

## පරිසරයේ අසිරිය



**ඩබ්ලිව්. නතාෂා ලිවේරා**
9 ශ්‍රේණිය,
සා. මරියා දහම් පාසල,
නයිනමඩම.

## අපේ පවුල



**සිව්මි අරුන්දි පීරිස්**
1 ශ්‍රේණිය, සා. ජුඩ් දහම් පාසල,
මත්තේගොඩ.

කෝට්ටේ සා. තෝමස් දහම් පාසලේ දරුවන් හට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා දීම පසුගියදා සිදු කෙරිනි. දරු දැරියෝ විසි අට දෙනෙක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දිව්‍ය පූජාවෙන් පසු ගරු ජේ.ඩී. ඇන්තනි මැක්සවල් සිලවා , ගරු අමිල රවින්ද යන පියතුමන්ලා ගරු පැවිදි සොයුරියන් සහ දහම් පාසල් ගුරුවරියන් ද සමඟ දරුවන් සමූහ ඡායාරූපයකට පෙනි සිටි අයුරු. **ශෙරීන් භාරතී**






## අගරදගුරු පදවිය



මතුගම සා. මරියා දහම් පාසලේ සිංහල හා දමිළ ළමුන් 30 දෙනෙකු පසුගියදා මතුගම මිදීමේ අප ස්වාමිදූගේ දෙව් මැදුරේ දී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීය. දේව මෙහෙය ගරු ජයලත් බලගල්ල පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

මීසම් සේවක ගරු දෙව්ශාන් අසංක පියතුමාගේ අනුශාසකත්වයෙන් මතුගම දොමිනිකාන කන්‍යාරාමයේ ගරු පැවිදි සොයුරියන්ගේ හා දහම් ගුරු භවතුන්ගේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරෙනි. දිව බොදුන් ලැබූ ළමුන් ගරු පියතුමන්ලා ගරු පැවිදි සොයුරියන් සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනි සිටි අයුරු මෙහි දිස්වේ. **සටහන - කුමර නයනජිත්, සේයා - රුවන් ගුණරත්න**



බුරුල්ලපිටිය ශු. ඌගෝ මුනිඳුන්ගේ දේවස්ථානයේ දරු දැරියන් 24 දෙනෙකුට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම පසුගියදා බුරුල්ලපිටිය ශු. ඌගෝ මුනිඳුන්ගේ දෙව් මැදුරේ දී මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

දේව මෙහෙයෙන් පසු ගරු පියතුමා, ළමුන් පුහුණු කළ ගරු පැවිදි සොයුරිය හා දහම් ගුරුවරිය ද සමග දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ළමුන් ළමා ප්‍රදීපය කැමරා කාචයට මුහුණ දුන් අයුරු. **ලක්ශාන් ප්‍රනාන්දු**



මීගමුව කඩොල්කැලේ සා. ජෝශප් ශාඛා විදුහලේ ළමුන් 145 දෙනෙකු පසුගියදා කඩොල්කැලේ උත්ථානවූ කිතු සමිඳුන්ගේ දෙව්මැදුරේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීය. දේව මෙහෙය අගරදගුරු පදවි විවාහ අධිකරණ නාහිමි අතිගරු ප්‍රැන්සිස් සේනානායක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. විදුහල්පති ගරු සුදත් ගුණතිලක පියතුමාගේ අනුශාසකත්වයෙන් උප විදුහල්පතිනි ෆෙලිසිටි මිරැන්ඩෝ මහත්මිය, ආචාර්ය මඩුල්ලේ ගරු ගයාන් ප්‍රසන්න පියතුමා හා 4 ශ්‍රේණියේ ගුරුවරියන්ගේ සහයෝගයෙන් මෙහි කටයුතු සංවිධානය කෙරෙනි. දිව බොදුන් ලැබූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **(ඉෂංකා සෝලංගආරච්චි)**

**8 පිටුවෙන්**

සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ එම අයගේ පවුල් වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරිමේ ජාත්‍යන්තර සම්මුතිය 1980 දෙසැම්බර් 18 වන දින සම්මත කර ගන්නා ලදි. මෙම සිදුවීම පාදක කර ගනිමි-න් දෙසැම්බර් 18 වන දිනට ජාත්‍යන්තර සංක්‍රමණික දිනය යෙදෙයි.

සියලු සංක්‍රමණිකයන්ගේ මිනිස් අයිතිවාසිකම්, මූලික නිදහස සහතික කිරීම සහ මානව අයිතිවාසිකම් තහවුරු කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම මෙම දිනයේ දී සිදු කරයි. රටක විදේශ විනිමය ගලා එන ක්‍රමයක් ද වන සංක්‍රමණික සේවාව වර්තමානයේ දී සංකීර්ණතා රාශියකට හේතු වි ඇත්තේ, අනියම් ක්‍රම මගින් රටවල්වලට යාමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබෙන බැවිනි. දැනට සංඛ්‍යා ලේඛනවලට අනුව තම උපන් බිමේ නොවන සංක්‍රමණිකයෝ මිලියන 130 ක ප්‍රමාණයක් ලොව පුරා විසිරී සිටිති.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ විගමනික ශ්‍රමය සම්බන්ධ සම්මුතියට අනුව, විගමනික ශ්‍රමිකයන් වර්ග කිහිපයකි. දේශ සීමාන්තර ශ්‍රමිකයන් (Frontier Workes") කලින් කලට වැඩ කරන ශ්‍රමිකයන් (Seasonal Workers) සාගර තුළ වැඩ කරන ශ්‍රමිකයන් (Offshore Installations) සංචාරක ශ්‍රමිකයන් Itinerant Workers ව්‍යාපෘති ශ්‍රමිකයන් Project workes ස්වයං රැකියා ශ්‍රමිකයන් ( Self Employment Worker) යනුවෙන් විගමනික ශ්‍රමිකයන් වර්ග කිහිපයකි.

මානව සංක්‍රමණය විවිධ අරමුණු පෙරදැරි කරගෙන සිදුවන්නකි. රැකීරක්ෂා (ආර්ථිකය පදනම් කරගෙන) පදිංචිය, දේශපාලනය වශයෙන් සංක්‍රමණය සඳහා හේතුවූ සාධක බොහොමයකි. ජාත්‍යන්තර සංක්‍රමණික දිනය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු මහා මණ්ඩලය සෑම වසරකම දෙසැම්බර් 18 වන දින ජාත්‍යන්තර සංක්‍රමණික දිනය ලෙස නම් කෙරිනි.

සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ එම අයගේ පවුල් වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය 1980 දෙසැම්බර් 18 වන දින සම්මත කර ගන්නා ලදි. මෙම සිදුවීම පාදක කර ගනිමින් දෙසැම්බර් 18 වන දිනට ජාත්‍යන්තර සංක්‍රමණික දිනය යෙදෙයි.

සියලු සංක්‍රමණිකයන්ගේ මිනිස් අයිතිවාසිකම්, මූලික නිදහස සහතික කිරීම සහ මානව අයිතිවාසිකම් තහවුරු කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම මෙම දිනයේ දී සිදු කරයි. රටක විදේශ විනිමය ගලා එන ක්‍රමයක් ද වන සංක්‍රමණික සේවාව වර්තමානයේ දී සංකීර්ණතා රාශියකට හේතු වි ඇත්තේ, අනියම් ක්‍රම මගින් රටවල්වලට යාමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබෙන බැවිනි. දැනට සංඛ්‍යා ලේඛනවලට අනුව තම උපන් බිමේ නොවන සංක්‍රමණිකයෝ මිලියන 130 ක ප්‍රමාණයක් ලොව පුරා විසිරී සිටිති.




බෝපිටිය එස්. පී. ඒ. විදානමග පෙර පාසලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය පසුගියදා ලියෝ ක්‍රීඩාංගනයේදීපැවැත්විණි. එහි තරග ඉසව් රැසක් පැවැති අතර අවු. 5 න් පහළ මීටර් 75 ඉසව්වෙන් ජයග්‍රහනය ලැබූ තරග කරුවෝ සම්මාන හා කුසලාන සමඟ ළමා ප්‍රදීපය කැමරා කාචයේ යටහත් වී තිබූ අයුරු.

**(ඇන්ටන් ජයසූරිය)**

# අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - නටාෂා යෙෂ්මිණි ජෝශප්

**ශ්‍රේණිය** - 3 ශ්‍රේණිය

**දහම් පාසල** - යහපත් එඬේරා කන්‍යාරාමය - මහනුවර

**කුසලතා** - ගායනය

# ප්‍රහේලිකා අංක 27



## හරහට

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ........... ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

## පහළට

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලූක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම – තිළිණි දුතිකා පෙරේරා )**

# අපි වෙමු කිතුනු ළමුන්

ළමා ප්‍රදීපය

නම :- ..........................................................................

ලිපිනය :- ....................................................................

පාසල :- .......................................................................

පංතිය :- ......................................................................

උපන් දිනය :- ...................... නිවසේ දු. අ. ...................

දහම් පාසල :- ..............................................................

මීසම :- .........................................................................

සහභාගි වන සමිති සමාගම් :- .......................................

කුසලතා දක්වන ක්ෂේත්‍රය :- ..........................................

(කවි කෙටි කතා. චිත්‍ර වාර්තා, වෙනත් )

අපි වෙමු කිතුනු ළමුන් වැඩ සටහනට මා ද ඇතුළත් කර ගන්න.

.................................... ..............................
අත්සන දිනය

**අපි වෙමු කිතුනු ළමුන් ළමා පාඨක එකමුතුවේ ලියාපදිංචි වීමට ඔබත් කැමති නම් ඉහත ළමා ප්‍රදීපය ලාංඡනය සහිත පත්‍රිකා තුනක් එකතු කර අයැදුම් පත්‍රය පුරවා 2x2 ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපි වෙමු කිතුනු ළමුන්, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 ලිපිනයට තැපැල් කරන්න.**

# ගැලවුම්කාර ජේසු

50 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා